www.agaram.lk



**3.** (අ) විද්‍යාත්මක ප්‍රකාශන විද්‍යාත්මක නොවන ප්‍රකාශන වලින් වෙන් කර ගැනීමට පොපර් ඉදිරිපත් කළ රීතිය දක්වා, ප්‍රකාශනයක් විද්‍යාත්මක වීම සඳහා එම ප්‍රකාශනය සපුරාලිය යුතු කරුණු පැහැදිලි කරන්න. (ලකුණු 04 යි)

(ආ) "සමාජ විද්‍යාවන් පොපේරියානු අර්ථයෙන් අසත්‍යකරණය කළ නොහැක": සමාජ විද්‍යාත්මක පර්යේෂණයෙහි පැන නගින අර්ථය, අනාවැකි කීම, පරීක්ෂණ පැවැත්වීම ආදී ගැටලු ගැන සලකමින් ඉහත ප්‍රකාශය සාකච්ඡා කරන්න. (ලකුණු 06 යි)

**4.** (අ) විද්‍යාත්මක පර්යේෂණයෙහිලා උපකරණවල භූමිකාව සැකෙවින් ඉදිරිපත් කරන්න. (ලකුණු 04 යි)

(ආ) ශුද්ධ විද්‍යාව හා ව්‍යවහාරික විද්‍යාව අතර ප්‍රභේදය සාකච්ඡා කරන්න. ශ්‍රී ලංකාව වැනි රටවල සියදිවි නසා ගැනීම වැනි සමාජ ගැටලු ගැන කෙරෙන ආනුභවික ගවේෂණයක් ශුද්ධ විද්‍යාත්මක මෙන්ම ව්‍යවහාරික විද්‍යාත්මක ලෙස සැලකිය හැකි ද? (ලකුණු 06 යි)

**5.** (අ) ඔබේ සංක්ෂේපණ රටාව ලියා දක්වමින් පහත දැක්වෙන තර්කය සංකේතයට නගා එහි සප්‍රමාණතාවය/නිෂ්ප්‍රමාණතාවය සත්‍යතා රුක් ක්‍රමය මගින් විමසන්න.

ඉදින් ෂර්ලොක් හෝම්ස් වැඩිපුර නින්දට වැටුණේ නම් හෝ වොට්සන් අවිනිශ්චිත තීරණයක වී නම් එවිට අපරාධකරු දකුණු ඇමෙරිකාවට බේරී යයි. අපරාධකරු දකුණු ඇමෙරිකාවට බේරී ගියේ නැත. එහෙයින් ෂර්ලොක් හෝම්ස් වැඩිපුර නින්දට වැටුණේ නැත. (ලකුණු 04 යි)

(ආ) (i) $((P \rightarrow Q) \leftrightarrow P)$

(ii) $((P \rightarrow \sim Q) \rightarrow (\sim P \rightarrow R))$

යන ප්‍රකාශන සඳහා තර්ක ද්වාර අඳින්න. (ලකුණු 06 යි)

## II කොටස

**6.** (අ) "විද්‍යාත්මක පර්යේෂණයන්හි වැදගත් භූමිකාවක් ආකෘතින්ගෙන් සිදු කෙරේ." තහවුරු කරන්න. (ලකුණු 06 යි)

(ආ) "විද්‍යා ක්‍රීඩාව ආනුභවික ගවේෂණය හා න්‍යායාත්මක කාර්යය අතර අන්‍යෝන්‍ය ක්‍රියාදාමයකි." අදහස් දක්වන්න. (ලකුණු 05 යි)

(ඉ) "නිරපේක්ෂකව අර්ථකථනයෙන් තොර දත්ත හා නිරපේක්ෂකව ප්‍රාග් විනිශ්චයෙන් තොර විද්‍යාඥයින් මායාවන් ය. ඇතිවිය හැක්කේ සාපේක්ෂකව අර්ථකථනයෙන් තොර දත්ත හා සාපේක්ෂව ප්‍රාග් විනිශ්චයෙන් තොර විද්‍යාඥයින් ය" යන ප්‍රකාශයට ඔබ එකඟ වන්නේ ද? (ලකුණු 04 යි)

**7.** (අ) සම්භාවිතාවය පිළිබඳ සාම්ප්‍රදායික නිර්වචනය කුමක් ද? දාදු කැට දෙකක් උඩ දැමූ විට ඒ දෙකෙහි ම තුනෙහි ඉලක්කම උඩු අතට හැරී වැටීමේ සම්භාවිතාව කුමක් ද? (ලකුණු 03 යි)

(ආ) සම්මත අපගමනය හා විචලතාව පිළිබඳ සංකල්ප පැහැදිලි කරන්න.
මධ්‍යන්‍ය අපගමනයට වඩා සම්මත අපගමනයට ඇති වාසිය කුමක් ද?
4, 5, 6, 8, 9 යන ප්‍රමාණවල සම්මත අපගමනය හා මධ්‍යන්‍ය අපගමනය ගණනය කර, එමගින් ඉහත වාසිය පෙන්වා දෙන්න. (ලකුණු 06 යි)

(ඉ) පර්යේෂණයට නියැදි අවශ්‍ය වන්නේ ඇයි?
මහවැලි කලාපයේ ජනපදයක ආර්ථික තත්වයන් පිළිබඳව කරන සමීක්ෂණයක දී සම්මුඛ සාකච්ඡා සඳහා පවුල් 500 ක ජනගහණයකින් පවුල් 50 ක් තෝරා ගැනීමට අවශ්‍ය ය. එම පවුල්වල ගෘහමූලික ලැයිස්තුවක් ද, නම් 1400 කින් සමන්විත ඡන්දදායක ලැයිස්තුවක් ද ටෙලිෆෝන් ඇති නිවාසවල දුරකතන 200 ක හිමිකරුවන්ගේ දුරකතන නාමාවලිය ද ඔබට සපයා ඇත. 50 කින් සැදි අහඹු නියැදියක් තෝරා ගැනීමේ දී ඉහත එක් එක් ලැයිස්තුවක් උපයෝගී කරගැනීමෙන් ඇති වන අවදානම් සාකච්ඡා කර ඔබ කුමන තේරීමක් හා ක්‍රියාමාර්ග යක් අනුගමනය කරන්නේදැ'යි සඳහන් කරන්න. (ලකුණු 06 යි)

[තුන්වැනි පිටුව බලන්න.

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

www.agaram.lk



**8.** (අ) ඔබේ සංක්ෂේපණ රටාවන් ලියා දක්වමින් පහත දැක්වෙන තර්ක වර්ග යොදාගනිමින් සංකේතවත් කර ඒවායේ සප්‍රමාණතාවය වෙන්රූප සටහන් ඇසුරෙන් නිගමනය කරන්න.

(i) කිසිම වාහනයක් ලියාපදිංචි නොකර නැත.
කිසිම විවාහයක් ලියාපදිංචි නොකර නැත.
එහෙයින් සමහර විවාහ වාහන ය.

(ii) සියලු ළමුන් ආදරයට පාත්‍රවන අය ය.
සමහර ළමුන් දඟකාර ය.
එහෙයින් සමහර දඟකාර අය ආදරයට පාත්‍රවන අය ය. (ලකුණු 06 යි)

(ආ) ඔබේ සංක්ෂේපණ රටාව ලියා දක්වමින් පහත දැක්වෙන තර්කය සංකේතයට නගා එය සප්‍රමාණ බව ව්‍යුත්පන්න ක්‍රමයෙන් පෙන්වා දෙන්න.

සියලු මිනිස්සු උන්නතිකාමියෝ ය. සමහර මිනිස්සු ව්‍යාපාරිකයෝ ය. එහෙයින් සමහර උන්නතිකාමීන් වන අය ව්‍යාපාරිකයන් ය. (ලකුණු 05 යි)

(ඉ) ඔබේ සංක්ෂේපණ රටා දක්වමින් පහත දැක්වෙන වාක්‍ය සංකේතවත් කරන්න.

(i) මන්ත්‍රීවරයා පාර්ලිමේන්තුවට පැමිණියේත් නැත ඔහු ඡන්දය දුන්නේ ද නැත යන්න අසත්‍ය ප්‍රකාශනයකි.

(ii) A හා B යන දෙදෙනාගෙන් එක් අයකු පමණක් ඡන්දය දිනයි. (ලකුණු 04 යි)

**9.** (අ) පහත දැක්වෙන ප්‍රමේයයන් සාධනය කරන්න.

(i) $(P \rightarrow (Q \wedge R)) \rightarrow ((P \wedge Q) \leftrightarrow (P \wedge R))$

(ii) $(\sim \mathrm{V}x\, Fx \leftrightarrow \Lambda x \sim Fx)$

(iii) $\mathrm{V}x\, Fx \leftrightarrow \mathrm{V}y\, Fy$ (ලකුණු 09 යි)

(ආ) පහත ඒවා ගැන සටහන් ලියන්න.

(i) උභතෝකෝටික

(ii) ව්‍යවහාර භාෂාව හා තර්ක ශාස්ත්‍රයෙහි සංකේතමය භාෂාව භාවිතය (ලකුණු 06 යි)

**10.** පහත දැක්වෙන **තුනක්** ගැන සටහන් ලියන්න.

(i) ලකටෝස්ගේ විද්‍යාත්මක පර්යේෂණ වැඩසටහන් විධි ක්‍රමවේදය

(ii) තාක්ෂණය හා පෘථිවිය මත අනාගත ජීවිත් – අප යන්නේ කොහි ද?

(iii) වෘත්තීන් සඳහා ආචාරධර්ම පද්ධති හා ඒවා ක්‍රියාත්මක කිරීම (05 × 3 = ලකුණු 15 යි)

* * *

Agaram.LK - Keep your dreams alive!
Agaram.LK - Keep your dreams alive!
agaram.lk

